# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,898 — 1970 මාර්තු 20 වැනි සිකුරාද — 1970.3.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 253 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 268 |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 258 | අය-වැය ලේඛන ... ... ... | 271 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 261 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 268 | විවිධ දැන්වීම් ... ... ... ... | 275 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී 139/46

### කළුතර නගර සභාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කළුතර නගර සභාව විසින් සම්මත කරනලද පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන ඇමතිතුමා විසින් අනුමත කරනු ලැබ, එම වගන්තියේ (2) වැනි උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

#### යෝජනාව

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙම සභාව විසින් සභාවේ පරිපාලන බල සීමාව ඇතුළත ප්‍රදේශ යෙහි පැවැත්වෙන (එකී ආඥාපණතෙහි විස්තර කර ඇති පරිදි) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව බද්දක් 1947 පෙබරවාරි මස 26 වැනි දින අංක 9672 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි සහ 1969 මැයි 22 වැනි දින අංක 14,855 දරණ ගැසට් පත්‍රයෙහිද, පළ කිරීමෙන් පනවා අයකරන ලද බද්ද වෙනුවට ,මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට බලපැවැත්වෙනසේ මෙයින් පනවා අයකරණු ලැබේ.

#### ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

ඇතුළුවීම සඳහා ගෙවනු ලබන මුදලට බදු මුදල ඇතුළත් නොවන අවස්ථාවන්හිදී—

| | | බදු ප්‍රමාණය |
|---|---|---|
| (අ) | ශත 20 ට වැඩි වන නමුත් ශත 40 ට වැඩි නොවන විට ... | ශත 05 |
| (ආ) | ශත 40 ට වැඩි වන නමුත් ශත 99 ට වැඩි නොවන විට ... | ශත 10 |
| (ඇ) | ශත 99 ට වැඩි වන නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... | ශත 25 |
| (ඈ) | රු. 1.50 ට වැඩි වන නමුත් රු. 2.00 ට වැඩි නොවන විට | ශත 35 |
| (ඉ) | රු. 2.00 ට වැඩි වන නමුත් රු. 2.50 ට වැඩි නොවන විට | ශත 50 |
| (ඊ) | රු. 2.50 ට වැඩි වන නමුත් රු. 3.00 ට වැඩි නොවන විට... | ශත 65 |
| (උ) | රු. 3.00 ට වැඩි වන නමුත් රු. 4.00 ට වැඩි නොවන විට... | ශත 75 |
| (ඌ) | රු. 4.00 ට වැඩි වන සෑම විටකම ගෙවන මුදලින් 20% ක බදු ගෙවිය යුතුයි ... ... | |

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1970.3.2 දින
කොළඹ දීය.

3–478—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල්.ඞී.—බී. 74/39

## ගම්සභා ආඥාපනත

(257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

1968 ජූනි මස 21 වැනි දින අංක 14,806/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු කලා ගම් පළාතේ ප්‍රාදේශිය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ මාමිණියා කෝරලේ ගම් ප්‍රදේශය උතුරු මාමිණියා කෝරලේ සහ දකුණු මාමිණියා කෝරලේ යනුවෙන් නව ගම්සභා දෙකකට බෙදා වෙන් කරන ආඥාවෙහි සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාල විය හැකි ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1968 දෙසැම්බර් මස 31 වෙනි දිනට වලංගුව පැවති සියලුම අතුරු ව්‍යවස්ථා, ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට, ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාක් හැර ඒ අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1968 දෙසැම්බර් 31 වෙනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලේ බැරට තිබෙන මුදලින් භාගයක් (විදුලිය ගිණුම හැර) 1969 ජනවාරි 1 වෙනි දින සිට දකුණු මාමිණියා කෝරලේ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතු අතර ඉතිරි භාගය උතුරු මාමිණියා කෝරලේ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

4. 1968 දෙසැම්බර් මස 31 වෙනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරේ පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපළ දකුණු මාමිණියා කෝරලේ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි 1969 ජනවාරි මස 1 වෙනි දින සිට පවරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, පැරණි ගම් ප්‍රදේශයේ ගම සභාවේ ඉතිරි චංචල දේපළ උතුරු මාමිණියා කෝරලේ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරිය යුතුය.

| | | |
|---|---|---|
| (1) | අල්මාරි | 1 යි |
| (2) | ලියන මේස | 1 යි |
| (3) | ලියන මේස | 1 යි |
| (4) | පුටු | 10 යි |

5. 1968 දෙසැම්බර් 31 වැනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ ඒ ඉඩම, ගොඩ නැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි 1969 ජනවාරි මස 1 වෙනි දින සිට පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම හිමිකම්, අයිතිවාසිකම්, ණයතුරුස් වගකීම් හා බැඳීම් ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට අදාලවන ප්‍රමාණයට ඒ අලුත් ගම්සභාවලට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයේ පවත්වා ගෙන යනු ලැබූ සියලුම ලිපිගොනු හා ලේඛන ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට අදාළ ප්‍රමාණයට 1969 ජනවාරි මස 1 වෙනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

8. පැරණි ගම් සභාවේ සේවයේ නියුක්තව සිටියාවූ සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් 1 : 1 අනුපාතයට දකුණු මාමිණියා කෝරලේ සහ උතුරු මාමිණියා කෝරලේ නව ගම්සභා අතර බෙදිය යුතුය.

9. මේ උපලේඛනයෙහි—

"අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, එය වෙනත් යම්කිසි අදහසකට සඳහන් කරනු ලැබුවහොත් මිස, 1968 ජූනි මස 21 වැනි දින අංක 14,806/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවට අදාල උපලේඛනයෙහි විස්තර කෙරෙන දකුණු මාමිණියා කෝරලේ ගම් ප්‍රදේශය හෝ උතුරු මාමිණියා කෝරලේ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

"පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අළුත් ගම් ප්‍රදේශ ඇතිවීමට පෙර වූ මාමිණියා කෝරලේ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

3–444—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී—බී 39/52 : ප. පා. කො—එච්.සී 1/2/32.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

වර්ෂ 1970.2.18 දින,
කොළඹ දී ය.

### ආඥාව

ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) උපවගන්තිය බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දපල්ල අංක 1 ගම් ප්‍රදේශයේ ගම් සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු යයි ප්‍රකාශයට පත් කරමින් 1966 නොවැම්බර් 28 වැනි දින අංක 14,723/2 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

3–473—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී—බී 3/63

## මොනරාගල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129(ආ) වැනි වගන්තිය යටතේ, හා එකී වගන්තියෙන් පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති, ජලසම්පාදන පහසුව සපයා ඇති ප්‍රදේශයෙහි පිහිටි සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින්වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි පරිදි 1970 වර්ෂය සඳහා මොනරාගල සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.3.4 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරන ස්ථාන පිහිටි ප්‍රදේශය :—

අංක 1 දරන කොට්ඨාශය

කුමාරදෙල පාර : 1, 3, 5, 7, 7ඒ, 9, 11, 11ඒ, 11/1, 13, 15, 17, 21, 21/1 23, 23/1, 23/2, 23/3, 23/4, 23/5, 27, 29, 31/1, 33ඒ, 35, 37, 39, 41, 45, 45ඒ, 47, 49, 51, 53, 55, 55ඒ, 57, 57/1, 59, 61, 63, 65, 67, 67 ඒ, 69, 71, 75, 77, 81, 81ඒ, 81/2

පොතුවිල් පාර : 8, 8/1, 10, 16, 18, 20, 22, 26, 30, 32, 40, 42, 44, 44/1

අංක 2 දරන කොට්ඨාශය

කුමාර දෙල පාර : 2, 4, 6, 14, 18, 20, 22, 24, 24/1, 24/2, 26, 28, 30, 34, 36, 38, 44, 46, 48, 50, 52, 54, 56, 58, 62, 64, 66, 70, 72, 74, 74/1, 76, 78, 82, 84, 88, 88ඒ, 84/1, 84/2, 92, 94, 96, 98, 104 108, 110, 110/1, 112, 112/1, 112/2, 112/3

වැදිකුඹුරුපාර : 5, 15, 25, 27, 29, 31, 31ඒ, 33, 35, 37

වැල්ලවාය පාර : 1, 9, 15, 19, 21, 25, 27, 29, 33, 35, 39, 41, 43, 45, 47, 49

අංක 3 දරන කොට්ඨාශය

දුටුගැමුණු පාර : 7, 15, 19, 21, 23, 27, 29, 31, 10, 16, 20, 20/1, 22, 30, 32, 34

වැදිකුඹුරු පාර : 2, 8, 14, 16, 20, 22, 24, 24/1, 26, 28, 30, 34, 36, 38, 38/1, 40, 42, 44/1, 48

වැල්ලවාය පාර : 65, 73, 75, 79, 107, 113, 115, 115/1, 115/2, 115/3, 115/4, 117/1, 117/4, 119, 125, 125/1, 125ඒ, 125බී, 125සී, 125/15, 125/16, 125/17, 125/18, 125/19, 125/20, 125/21, 125/22, 125/23, 125/24, 125/26, 125/27, 125/28, 125/29, 125/30, 131/1, 131/2, 131/3, 131/10, 131/11, 131/12, 131/13, 131/14, 131/15, 131/16, 131/17, 131/18, 131/19, 131/20, 131/21, 131/21, 147, 149, 151, 153, 155, 157, 159, 125/25

අංක 4 දරන කොට්ඨාශය

වැල්ලවාය පාර : 190, 198, 198/1, 200, 204, 218, 220, 222, 224, 270, 274/1, 278, 282, 286, 290, 290/1, 300, 304, 310, 320, 322, 328

බිබිල පාර : 1, 5, 6, 8, 10, 12, 14, 18, 20, 20/1, 7

කච්චේරිය පාර : 4, 8

අංක 5 දරන කොට්ඨාශය

මහානාම පාර : 15, 17, 21, 21/1, 25, 25/2, 41, 35

වැල්ලවාය පාර : 46, 48, 48/1, 48/2, 48/3, 50, 52, 54, 62, 40, 40/1, 40/7, 40/10, 44, 60, 66, 70, 72, 74, 76, 80, 82, 84, 86, 86/1, 88, 90, 92, 96, 104, 110, 114, 120, 124, 126, 128, 134, 136, 138, 140, 162, 166, 168, 170, 174, 174/1, 176, 178

අංක 6 දරන කොට්ඨාශය

මහානාම පාර : 2, 2/1, 10, 20, 26

පොතුවිල් පාර : 1, 3, 5, 11, 17, 19, 21, 23, 23/1, 33, 33/1, 41

වැල්ලවාය පාර : 2, 4, 4ඒ, 10, 12, 16, 24, 30, 32, 34, 36, 36/1, 38

3–449—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 37/40

## මඩකලපුව මහ නගර සභාව

### මඩකලපුව ජල කර්මාන්ත ආඥපනත

(209 වැනි අධිකාරය වන) මඩකලපුව ජල කර්මාන්ත ආඥපනතේ 4 (1) වැනි වගන්තිය යටතේ, මඩකලපුව මහ නගර සභා සීමාව තුළ පිහිටි සියලුම ගෙවල්, ගොඩනැගිලි ඉඩම් හා ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ ජල බද්දක් 1970 වර්ෂයේ පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී හෝ ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් ගෙවිය යුතු පරිදි 1970 වර්ෂය සඳහා මඩකලපුව මහ නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1970 මාර්තු මස 4 දින,
කොළඹ දී ය.

3–450—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.–බී. 14/64

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

### 1970 සඳහා වූ කශල ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) වන වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දෙනු ලැබූ පළාත් පාලන ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම්වලට හා නිදහස් කිරීම්වලට යටත්ව, පැල්මඩුල්ල නගරය තුළ පිහිටියාවූද, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇත්තාවූද, සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුන බැගින්වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වනසේ, 1970 වර්ෂය සඳහා පැල්මඩුල්ල සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 4 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

පහත දැක්වෙන වරිපනම් අංක දරණ ස්ථාන පිහිටි ප්‍රදේශ :—

කොට්ඨාශ අංක 2—විද්‍යාලය පෙදෙස

කුට්ටාපිටිය පාර : 17, 17/1, 19, 19/1, 21, 23, 25, 25/1, 27, 29, 31, 31/1, 33, 35, 35/1, 37, 39, 41, 43, 45, 47, 57, 37/1, 59, 59/1, 61, 63, 63/1, 69, 77, 77/1, 79, 81, 8, 12, 14, 14ඒ, 14බී, 14සී, 14ඩී 14ඊ, 22, 24, 24/1, 24/5, 24/6, 24/7, 28, 34, 34/1, 48, 48/1, 54, 58, 58/1, 58/2, 58/3.

කුට්ටාපිටිය හරස් පාර : 1, 5, 7, 9, 11, 11/1, 11/2, 15, 15/1, 15/2, 15/3, 15/4, 17, 19, 21/1, 21/2.

රත්නපුර පාර : 73, 81, 85, 91, 93ඒ, 95, 97, 101, 105, 107, 109, 111, 113, 115, 117, 127, 129, 131, 133, 133/1, 135, 137, 110, 112, 114, 116, 118, 132, 134, 136, 148, 158, 162, 164, 166, 168, 170, 194, 194/4, 194/5, 194/6, 196, 198, 200, 204, 206/1, 206/2.

කොට්ඨාශ අංක 3—කළුගම්මුල්ල

බෝපිටිය පාර : 6, 8.

රක්වාන පාර : 2, 4, 6, 8, 10, 14, 16, 16/1, 16/2, 18, 22, 22/1, 22/2, 22/2ඒ, 22/3, 22/8, 22/9, 22/30, 22/31, 22/32, 22/33, 24, 26, 28, 30, 40, 50, 52, 58, 60, 62, 62/1, 62/2, 62/3, 66, 70, 74, 72, 76, 78, 80, 88, 90, 94, 96, 96/1, 100, 102, 108, 110.

රත්නපුර පාර : 1, 3, 3/1, 11, 11/1, 13, 13ඒ, 15, 17, 19, 21, 23, 23ඒ, 25, 27, 31, 33, 35, 37, 39, 41, 43, 47, 49, 51, 53, 55, 57, 59, 61, 61/1.

කොට්ඨාශ අංක 4—කඩ වීදිය

බලන්ගොඩ පාර : 3, 5, 7, 11, 15, 17, 19, 21, 23, 25, 27, 31, 33, 35, 39, 41, 45, 45/1, 45/2, 45/3, 45/4, 45/5, 47, 55, 57, 57/1, 59, 61, 61ඒ, 63, 65, 73, 75, 75/1, 77, 85, 85/1, 85/3, 85/5, 87, 91, 93, 95, 95ඒ, 97, 101, 103, 103/1, 103/2, 103/3, 105, 105/1, 115, 115/1, 115/1ඒ, 115/2, 115/3, 115/4, 115/5, 121, 121/1, 123, 125, 4, 14, 18, 22, 24, 24ඒ, 24/1, 24/2, 28, 30, 32, 34, 36, 38, 40, 42, 50, 46.

රත්නපුර පාර : 2, 4, 6, 10, 14, 16, 18, 20, 22, 26, 30, 34, 36, 36/2, 36/3, 36/3ඒ, 36/4, 36/5, 36/6, 36/7, 36/8, 36/9, 36/10, 36/11, 36/12, 36/14, 36/15, 36/16, 36/18, 36/19, 36/20, 36/21, 36/22, 36/23, 36/23ඒ, 36/23බී, 36/23සී, 36/23ඩී, 36/23ඊ, 36/23ඇෆ්, 36/24, 36/24ඒ, 36/27, 36/28, 36/30, 36/31, 36/32, 38, 42, 44, 48, 52, 58, 60, 66, 70ඒ, 70බී, 74, 76, 78, 82, 84, 86, 88, 90, 92, 94, 96, 96/1, 96/2, 96/3.

රක්වාන පාර : 5, 7, 9, 13, 15, 17, 23, 25, 27, 31, 33, 35, 43, 45, 47.

පන්සල පාර : 7, 15.

කුට්ටාපිටිය රවුම් පාර : 5, 7, 11, 15, 15/1, 15/2, 15/3, 15/5, 4, 6, 14, 16, 16/1.

කොට්ඨාශ අංක 5—විහාරගම

බලන්ගොඩ පාර : 60, 66, 68, 70, 72, 74, 76, 78, 80, 84, 84/1, 84/3, 84/4, 84/6, 84/7, 84/8, 84/9, 84/10, 84/11, 86, 86/1, 86/1ඒ, 86/2, 86/4, 88, 90, 92, 94, 96, 96/1, 96/2, 96/3, 96/4, 96/5, 96/6, 100.

පන්සල පාර : 6, 14/1, 14/5, 22.

රක්වාන පාර : 49, 49ඒ, 51, 55, 63, 63/1, 71, 73, 81, 81/1, 81/2.

කොට්ඨාශ අංක 7—කෙටේතැන්න

කෙටේතැන්න-මොරතොට පාර : 3, 5, 7, 9, 11, 15, 17, 21, 23, 25, 29, 31, 33, 35, 37, 39, 41, 43, 53, 61, 73, 77, 79, 83, 85, 87, 89, 6, 8, 12, 16, 16/1, 20, 26, 28, 30, 32, 36, 42, 44, 48, 56, 62, 64, 66, 70, 74, 78, 82, 82/1, 86, 92, 92/4, 92/5, 92/6, 92/7, 92/8, 94, 98, 104, 106, 110, 114.

කාමරංගාපිටිය පාර : 7, 6, 10, 12, 14, 18, 22, 26, 28, 30, 32, 36, 42.

රක්වාන පාර : 473, 473/1, 473/2, 473/3, 475, 477, 479, 481, 481/1, 481/2, 481/3, 481/7, 483/1, 483/2, 483/3, 491, 491/1, 493, 495, 497, 499, 501, 503, 507, 509, 511, 511/1, 515, 517, 525, 531, 543, 545, 545/1, 547, 549, 551, 551ඒ, 551/1, 551/2, 551/3, 551/4, 551/5, 553, 559, 561, 563, 563/1, 567, 571, 579, 581, 583, 585, 587, 589, 591, 593, 595, 599, 601.

රක්වාන පාර : 603, 605, 607, 611, 617, 619, 621, 621/1, 627, 627/1, 629, 631, 637, 647, 378, 380, 382, 384, 386, 388, 390, 394, 402, 404, 406, 408, 420, 426, 426/1, 428, 430, 432, 434, 434/1, 436, 438, 440, 448, 450, 452, 456, 470, 472, 474, 476, 482, 482/1, 484, 486, 488, 490, 492, 496, 500, 502, 504, 508, 512, 514, 516, 518, 520, 522, 524, 526, 528, 530, 534, 536, 552, 556.

3–451—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 11/45.

## කුලියාපිටිය නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 130 (ආ) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථා වලින් නියම කල හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, කුලියාපිටිය නගර සභා සීමාව තුළ පිහිටි සියලුම නිශ්වල දේපළවල (මුඩු ඉඩම් සහ කුඹුරු හැර) වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් සමාන කොටස් හතරකින් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31 යන දිනයන්හි ගෙවිය හැකි වන සේ 1970 වැනි වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 1,
කොළඹ දී ය.

3–476—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 29/62.

## ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියමිත බලධරයා විසින්, එනම්, දන්කොටුව සුළු නගර සභාව විසින් සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹදීය.

### නියෝග

1. කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැන විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසුයයි අනුමත කර තිබේනම් මිස ; හෝ

(ආ) මෙම නියෝගයේ (අ) ඡේදය යටතේ ඒ සතා මැරීමට අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 24ක කාලසීමාවක් ඉකුත්වී යාමෙන් පසුව යම් අවස්ථාවකදී ; හෝ

(ඇ) කිසියම් දිනක පූ. භා. 9ටත් 12ටත් අතර කාලයේදී මිස ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එසේ වුවද, විශේෂයයි තමා අදහස් කරන අවස්ථාවකදී මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. 1 වැනි නියෝගය යටතේ අනුමත කළ සතකු ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත්කර ඇත්නම්, ඒ සතා නැවතත් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසුයයි එකී නියෝගය යටතේ අනුමත කරනු ලැබුවහොත් මිස කිසිම තැනැත්තකු විසින් ඒ සතා ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. (1) යම් සතෙකු 1 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළ පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට නුසුදුසු බව පෙනී ගිය හොත් ඒ සතා මැරීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් තහනම් කළ හැකියි.

(2) මෙම නියෝගය යටතේ මැරීම තහනම් කරනු ලැබූ යම් සතකු කිසිම තැනැත්තකු විසින් නොමැරිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම, ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමි භාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය සියළු විධිවිධාන යෙදිය යුතුය

5. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම, ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරණ ලද්දේ නම්, එසේ ප්‍රතික්ෂේප කල වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කිරීමට සැලැස්විය යුතුය.

6. ගෝ ඝාතක ස්ථානයේදී මරණ ලද යම් සතකුගේ මස් හෝ අතුනු බහන් ආදිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම්, ඒ මස් හෝ අතුනු බහන් වෙළඳාම සඳහා විවෘතව තැබීම හෝ මිනිසුන්ගේ ආහාරය වශයෙන් පාවිච්චි කිරීම හෝ වැළැක්වීම් වස් වහාම විනාශ කර දැමීමට හෝ ඒ පිළිබඳව සුදුස්සක් කිරීමට ඔහු විසින් කටයුතු සැලැස්විය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් එකී මස් හෝ අතුනු බහන් හෝ ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසුයයි අනුමත කර නැති හෝ 3 වැනි නියෝගය යටතේ මැරීම තහනම් කර ඇති කිසිම සතකු ගෝ ඝාතක ස්ථානයේදී මස් පිණිස මැරීමට ගෝ ඝාතක ස්ථානයේ භාරකරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානයේ භාරකරු විසින් "ඩී. සී. සී." යන අකුරු සඳහන් මුද්‍රාව තබා තිබේනම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ කුණපය ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතකු ඉදිරියේ හෝ ඒ ස්ථානයේ කලින් මරණ ලද සෑම සතකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර හෝ ඒ ස්ථානය පිරිසිදු කරන තුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. යම්කිසි බෝවෙන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි යමකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කිසිම තැනැත්තකුට, එකී රෝගය බෝවෙන හෝ රෝග බීජ මෝරන කාලසීමාව ඉකුත්වන තුරු, යම්කිසි ගෝ ඝාතක ස්ථානයකට ඇතුළු වීමට හෝ මස් පිණිස සතුන් මැරීමේ කටයුතු වල යෙදීමට එම ගෝ ඝාතක ස්ථානයක භාරකරු විසින් අවසර නොදිය යුතුය.

11. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් සුදුසු සියලුම අවස්ථාවලදී ගෝ ඝාතක ස්ථානයකට ඇතුළුවී එකී ස්ථානය පරීක්ෂාකර බලනු ලැබීම නීත්‍යානුකූල විය යුතු අතර, එම ස්ථානයෙහි භාරකරු විසින් ඔහුට ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලුම ආධාර දිය යුතුය.

12. සභාව විසින් පිහිටුවා ඇති ගෝ ඝාතක ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතුය. ගාස්තු ගෙවූ බවට සාක්ෂි වශයෙන් සභා කාර්යාලයෙන් ලබා ගත් කුවිතාන්සියක් නැතිව කිසිම සතකු නොමැරිය යුතුය.

| | රු. | ශ. |
|---|---|---|
| එක් ගවයකු සඳහා ... ... | 1 | 0 |
| එක් එළුවකු හෝ බැටළුවකු සඳහා ... ... | 0 | 50 |

13. ගෝ ඝාතක ස්ථානයෙහි මරණු ලබන එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛනයක් සභාව විසින් නියම කළ හැකි ආකාරයකින් සෑම ගෝ ඝාතක ස්ථානයකම භාරකරු විසින් පවත්වා ගෙන යා යුතුය.

14. මෙම නියෝගවලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත පවරනු ලබන බලතල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ සාමාන්‍ය හෝ විශේෂ නියමය යටතේ ක්‍රියා කරන ඕනෑම නිලධාරියකු විසින් ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

15. මෙම නියෝගවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිවරයා අදහස් වේ; සහ
"සභාව" යනුවෙන් දන්කොටුව සුළු නගර සභාව අදහස් වේ.

3–462—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 19/51.

## ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියමිත බලධරයා විසින්, එනම්, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දිය.

### නියෝග

1. කිසිම තැනැත්තකු විසින් යම් සතකු කිසිදු ගෝ ඝාතක ස්ථානයකදී—

(අ) ඒ සතා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමතකර නො තිබේ නම්, හා

(ආ) මෙම නියෝගයේ (අ) ඡේදය යටතේ ඒ සතා අනුමත කරනු ලැබූ වේලවෙන් පැය 24 ක කාලසීමාවක් ඉකුත්වී යාමෙන් පසුව යම් වේලාවක, හා

(ඇ) කිසි යම් දිනක පූ. භා. 9 ටත් දහවල් 12 ටත් අතර කාලයේදී මිස නොමැරිය යුතුය. එසේ වුවද විශේෂ යයි තමා අදහස් කරන අවස්ථාවකදී මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. යම් සතකු (1) වැනි නියෝගය යටතේ අනුමත කළ පසු ගෝඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇති නම්, ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසු යයි එකී නියෝගය යටතේ නැවත අනුමත කර නොමැති නම් කිසිම තැනැත්තෙකු විසින් ඒ සතා යම් ගෝ ඝාතක ස්ථානයකදී නොමැරිය යුතුය.

3. (1) යම් සතකු 1 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළ පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට නුසුදුසු බව පෙනී ගියහොත් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

(2) මෙම නියෝගය යටතේ මැරීම තහනම් කරනු ලැබූ යම් සතෙකු කිසිම තැනැත්තෙකු විසින් නොමැරිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයකට යම් සතකු ගෙන එන සැම තැනැත්තෙකු විසින්ම, ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමි භාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සියලු විධිවිධාන යෙදිය යුතුය.

5. ගෝ ඝාතක ස්ථානයකට යම් සතකු ගෙන එන සැම තැනැත්තෙකු විසින්ම, ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරනු ලැබීමට සැලැස්විය යුතුය.

6. යම් ගෝ ඝාතක ස්ථානයකදී මරණ ලද යම් සතකුගේ මළකුණ හෝ අවමස් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම්, ඒ මළකුණ හෝ අවමස් වෙළඳාම් සඳහා තැබීම හෝ මිනිසුන්ගේ ආහාරය වශයෙන් පාවිච්චි කිරීම වැළැක්වීම පිණිස ඔහු විසින් ඒ මළකුණ හෝ අවමස් වහාම විනාශකර දැමීමට හෝ ඒ පිළිබඳව සුදුසු සක් කිරීමට සැලැස්විය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් එකී මළකුණ හෝ අවමස් ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 3 වැනි නියෝගය යටතේ මැරීම තහනම්කර ඇත්තාවූ කිසිම සතකු එම ස්ථානයේදී මැරීමට ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරණ ලද යම් සතකුගේ මළකුණ, කාරණයට ගැලපෙන පරිදි, ඒ මළකුණේ ඉස්සරහ ගාත් වලත් පස්සා ගාත් වලත් ගෝ ඝාතක ස්ථානයෙහි භාරකරු විසින් "හ.ප.උ.ග.ස." යන අකුරු හා "දේශීය හරක් මස්", "එළු මස්", හෝ "ඌරු මස්" යන සලකුණු වලින් එකක් සඳහන් මුද්‍රාව පිහිටුවා තිබේනම් මිස, කිසිම තැනැත්තෙකු විසින් ඒ මළකුණ ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතකු ඉදිරියේදීද ඒ ස්ථානයේ කලින් මරණ ලද සැම සතකුගේම මළකුණ ඉවත් කර හෝ මුවාකර ඒ ස්ථානය පිරිසිදු කර නොමැතිවිටදීද කිසිම සතකු නොමැරිය යුතුය.

10. යම්කිසි බෝවන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන්නාවූ හෝ මෑතකදී පෙළෙමින් සිටියාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි යමෙකුට මෑතකදී සාත්තුකරමින් සිටියාවූ හෝ කිසිම තැනැත්තෙකුට එකී රෝගය බෝවෙන හෝ රෝග බීජ මෝරන කාලසීමාව ඉකුත්වන තුරු යම් ගෝ ඝාතක ස්ථානයකට ඇතුළුවීමට හෝ මස් පිණිස සතුන් මැරීමේ කටයුතුවල යෙදීමට, ගෝ ඝාතක ස්ථානයක භාරකරු විසින් අවසර නොදිය යුතුය.

11. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සුදුසු සියළුම අවස්ථා වලදී ගෝ ඝාතක ස්ථානයකට ඇතුලුවී එකී ස්ථාන පරීක්ෂාකර බලනු ලැබීම නිත්‍යානුකූල විය යුතු අතර, එම ස්ථානයෙහි භාරකරු විසින් ඔහුට අවශ්‍ය විය හැකි සියලුම ආධාර දිය යුතුය.

12. සභාව විසින් පිහිටුවා ඇති යම් ගෝ ඝාතක ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතුය. ගාස්තු ගෙවූ බවට සාක්ෂි වශයෙන් නිල කුවිතාන්සියක් නැතිව කිසිම සතකු නොමැරිය යුතුය.

| | රු. ශත |
|---|---|
| හරකුන් සඳහා, එකකුට ... | 1 0 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා, එකකුට ... | 50 |

13. ගෝ ඝාතක ස්ථානයෙහි මරනු ලබන එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛණයක් සභාව විසින් නියම කළ හැකි ආකාරයකින් සැම ගෝ ඝාතක ස්ථානයක්ම භාරකරු විසින් තබාගත යුතුය.

14. මෙම නියෝග වලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වෙත පවරනු ලබන බලතල, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නියමය යටතේ ක්‍රියා කරණ යම් නිලධාරියකු විසින් ක්‍රියාවේ යෙද විය හැකිය.

15. මෙම නියෝගවල :—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිවරයා අදහස් වේ;
"සභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

3-465—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 19/45.

## තංගල්ල නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 130 (ආ) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ, තංගල්ල නගරය තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින්වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් 1970 වර්ෂය සඳහා තංගල්ල නගර සභාව විසින් ඒ වගන්තිය යටතේ පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන.
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969.3. මස 1 දින,
කොළඹ දී ය.

3-475—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්. සී.—බී. 39/52—ප.පා. දෙ/එච් ඒ 5/1/14/11.

### ගම්සභා ආඥාපනත

**ආඥාව**

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, එකී වගන්තියේ (1) වැනි උප වගන්තිය, යාපනය දිස්ත්‍රික්කයේ කොකුවිල් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාල නොවිය යුතු බැව් මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ.

3–474—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

### පළාත් පාලන අමාත්‍යාංශය

**වර්තමාන නිවිතිගල ගම්සභා ප්‍රදේශයෙන් නව ගම්සභා දෙකක් සංස්ථාපනය කිරීම**

පහත සඳහන් කාරණා පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් නිල කමිටුවක් පත් කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

(අ) වර්තමාන නිවිතිගල ගම්සභා ප්‍රදේශයෙන් නව ගම්සභා දෙකක් සංස්ථාපනය කිරීම.

(ආ) එක් එක් සභාවක් සමන්විත විය යුතු කොට්ඨාශ ගණන.

(ඇ) යෝජිත ගම්සභා දෙකට ඇතුලත් කොට්ඨාශ සීමාවන්ගේ විස්තර.

නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති නොයෙකුත් සංවිධාන හා මහජනයා එවැනි නියෝජනයන් 1970 අප්‍රේල් මස 10 වැනි දින හෝ ඊට මත්තෙන් රත්නපුර, පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලියා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටී.

නියෝජනයන් පිටපත් තුනකින් සමන්විත විය යුතු අතර ඒවා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

ඩොනල්ඩ් අබේසිංහ,
නිල කමිටුවේ සභාපති හා රත්නපුර
පළාත් පාලන සහකාර කොමසාරිස්.

1970 මාර්තු මස 12 වැනි දින,
රත්නපුර, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලය.

3–443—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥා පනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශීක බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරීන්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීක බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරීන්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීක බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශීක බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස ''නව ප්‍රවේශක නිලධාරීන්ටත්'' නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මෙ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සැම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.

(ඇ) කාර්යක්ෂමතා කඩයිම.—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වූවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

5 අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදනම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙය අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වූවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

අනන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :

අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

**7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—**

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—**

**(අ) සිංහල :————.**

**(ආ) ඉංග්‍රීසි :————.**

**(ඇ) ගණිතය :————.**

**9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.**

**10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.**

**11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.**

**(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.**

**(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.**

**(ඈ) දැනට කරන රක්ෂාව—සංක්ෂිප්ත සඳහන් විස්තර දෙන්න :—**

**(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.**

**(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.**

**(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.**

**(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :**

**සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.**

**12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—**

**(අ) සිංහල :————.**

**(ආ) දෙමළ :————.**

**13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.**

**14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.**

**15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.**

**16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.**

**17. චරිත සහතික ලබාගත් අයගේ නම සහ පදවි නාම :————.**

**(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)**

**මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් කෙනකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.**

————,
අයදුම්කරුගේ අත්සන.

**දිනය :————.**

ලේකම්,
**පළාත් පාලන සේවා කොමිෂන් සභාව,**
**තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.**

## පළාත් පාලන සේවය

**නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙහි සෞඛ්‍ය කරන ස්ථාන හා නිවාරණ යන්ත්‍රාගාර ඉංජිනේරු සහකාර තනතුර—කොළඹ නාගරික සභාව**

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **වැටුප් පරිමාණය.**—තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණය. වර්ෂයකට රු. 7,800—360×9—480×3—රු. 12,480 යනුවෙනි. රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණ හා කොන්දේසි අනුව විධාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(i) **වයස.**—1970.4.17 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ii) (අ) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව (යාන්ත්‍රික) සතුටු දායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි. එසේ නැත හොත්, පිළිගත් ආයතනයකින් හෝ සංගමයකින් ලබා ගත් ඒ හා සමාන සුදුසුකමක් අයදුම්කරුවන්ට තිබිය යුතුය.

(ආ) රජය හෝ පළාත් පාලන සේවය යටතේ පිළිගත් ආයතනයක යන්ත්‍ර සහ අනෙක් උපකරණ සවි කිරීම්, නඩත්තු කිරීම්, සර්විස් කිරීම් සහ මූළුමනින්ම අළුත් වැඩියා කිරීම් පිළිබඳව යටත් පිරිසෙයින් දස වසක පළපුරුද්ද තිබිය යුතුය. මෙයින් අඩු වශයෙන් සය අවුරුද්දක් පරිපාලන තත්ත්වයක විය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

5 ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1970.4.17 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 9 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3-501—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධිකාරී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **වැටුප.**—තනතුරට අදාල වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 8,280 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් සහිතව රු. 6,600—රු. 180×240 රු. 9,240 කි. රජයේ සේවකයින්ට අදාළ වන ප්‍රමාණ හා කොන්දේසි අනුව විවාහක දීමනාවක්ද විවාහක නිළධාරීන්ට ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාර ගනු ලැබේ :—

(අ) කොළඹ මහ නගර සභාවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂකයින් හා තමනට අදාළ ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සමත් වී ඇති වෙනත් ප්‍රාදේශීය බලමණ්ඩලවල I වැනි හා II වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරීන් හා සමාන තත්ත්වයේ වෙනත් නිලධාරීන් ;

(ආ) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඇති, 1955 පළාත් පාලන සේවා වැටුප් යෝජනා ක්‍රමය යොදා ගැනීමට ප්‍රථම යෙන් (1955.11.12 දිනට ප්‍රථම) පත් කරන ලද පරීක්ෂක වරුන් ලෙස පත් කරන ලද කොළඹ නගර සභාවේ පරීක්ෂකයින් :—

(i) ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්) ;

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) ; හෝ

(iv) වෙනත් සමාන සුදුසුකමක්.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නොසමත්, මේ ගණයේ නිලධාරීන් තෝරාගනු ලැබුවහොත්, පත්වීම ලැබී දැවුරුද්දක් ඇතුළත රෙගුලාසි, අතුරු ව්‍යවස්ථා, ආඥාපනත් ආදිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයෙන් සමත් වන ලෙස නියම කරනු ලැබේ. ඔවුන් එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔවුන්ගේ පළමු තනතුරුවලට ආපසු පත් කරනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

5 ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1970.4.17 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 9 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3–502—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහයක තනතුර—ඌරගස්මන්හන්දිය ගම්සභාව

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804—රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස.**—1970 අප්‍රේල් මස 5 වැනි දිනට වයස අවුරුදු 20 නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුයි.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල සථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1970 අප්‍රේල් මස 5 වැනි දිනට හෝ ඊට පළමු ඌරගස්මන්හන්දිය ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

අයි. ඩී. ලැන්ට්,
ඌරගස්මන්හන්දිය ගම්සභාවේ සභාපති.

1970 මාර්තු 3 වැනි දින,
ඌරගස්මන්හන්දිය,
ගම්සභා කාර්යාලයේදීය.

3–503—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. සී.—බී. 37/48

## තලවාකැලේ—ලිඳුල නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි සහ 157 වැනි වගන්ති යටතේ තලවාකැලේ-ලිඳුල නගර සභාව විසින් පනවනු ලැබ එම ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

මෙම සභාව විසින් පිළිගන්නා ලද (XVI වැනි කාණ්ඩය වන) පොදු වෙළඳපොල පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා කුලිය පහත සඳහන් පරිදි විය යුතුය :—

| | | | |
|---|---|---|---|
| (1) | හරක් මස් කඩපිළක් සඳහා | මසකට | රු. 75 0 |
| (2) | එළු මස් කඩපිළක් සඳහා | මසකට | රු. 60 0 |
| (3) | මාළු කඩපිළක් සඳහා | මසකට | රු. 25 0 |
| (4) | එළවළු කඩපිළක් සඳහා | මසකට | රු. 20 0 |
| (5) | සාප්පුවක් සඳහා ඉඩකඩ ලබාදීමට | මසකට | රු. 27 50 |

2. මෙම සභාව විසින් පිළිගන්නා ලද (XVI වැනි කාණ්ඩය වන) පොදු වෙළඳපොල පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් ගාස්තුව බලපත්‍රයක් වලංගුව පැවැත්වෙන සෑම මසකටම රුපියල් එකක් බැගින් විය යුතුය.

3–481—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්. ඞී.—බී. 31/45

## වත්තල-මාබෝලෙ නගරය

### නගර සහ ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සහ ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ වත්තල-මාබෝලේ නගරයේ විශේෂ කොමසාරිස් මගින් සම්පාදනය කර 154 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව ගරු පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දී ය.

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

මෙහි පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැළකිය යුතුය :—

අඟුරු ගබඩා කිරීම.
එළු කොටුවක් පවත්වාගෙන යාම.
සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
පෝර ගබඩා කිරීම.
බෝට්ටු නිෂ්පාදක ස්ථානයක් පවත්වාගෙන යාම.
හොණ්ඩර 3 කට වඩා කරවල ගබඩා කිරීම.
හොණ්ඩර 3 කට වඩා උම්බලකඩ ගබඩා කිරීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
ලුණු මාලු හෝ ජාඩි ගබඩාවක් පවත්වාගෙන යාම.
හුණු ගබඩාවක් පවත්වාගෙන යාම.
වෑල්ඩිං වැඩපළක් පවත්වාගෙන යාම.

2. මෙහි පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර ලෙස සැළකිය යුතුය :—

කොහු ගබඩා කිරීම.
කම්හලක් පවත් වා ගෙන යාම.
බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම.
ගිස් ගෝනි ගබඩා කිරීම.
පිදුරු ගබඩා කිරීම.
රත්පිදී බඩු නිෂ්පාදනය කිරීම.
සෙක්කුවක් පවත්වාගෙන යාම.
හිස් බෝතල් ගබඩා කිරීම.
කොහු හෝ කෙඳි වර්ග වලින් සාදනු ලබන භාණ්ඩ ගබඩා කිරීම.
සායම් වර්ග සහ වාර්නිස් ගබඩා කිරීම.

3. මෙහි පහත සඳහන් ව්‍යාපාරයන් අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැළකිය යුතුය :—

ගැලුම් 50 ට වැඩියෙන් පොල් තෙල් ගබඩා කිරීම.
ලී ගබඩාවක් පවත්වාගෙන යාම.
ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

3–480—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—බී. 63/49

## කෑගල්ල නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ කෑගලු නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥාපනතේ අංක 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 1 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1952 සැප්තැම්බර් 5 වැනි දින අංක 10,443 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ වරින් වර සංශෝධිතව ඇති කෑගලු වෙළඳ පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ "ප්‍රසිද්ධ වෙළඳ පොළ" යන්නෙහි විස්තරයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් විස්තරය අන්තර්ගත කිරීමෙන් :—
"පොළ" යන්නෙන් නගර සභාව විසින් පිහිටුවා ඇති "කෑගල්ලේ පොළ" අදහස් වේ. තවද

(2) 23 වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අතුරු ව්‍යවස්ථා අන්තර්ගත කිරීමෙන් :—

**"කෑගල්ලේ පොළ"**

24. කලින් කල සභාව විසින් ඒ සඳහා සම්මත කරනු ලබන යෝජනාවක් මගින් නියම කළ හැකි දිනවල, වේලාවල සහ ස්ථානවල පොළ පැවැත්විය යුතු ය.

25. (1) පොළට අයිති භූමිය තුළ යම් එළවලු, පළතුරු මෙරට සහල්, වී, පොල්, සියඹලා, කොල්ලු, කුරක්කන්, කඩල, ධාන්‍ය වර්ග, මාෂ බෝග, බදරි වර්ග, අල වර්ග, මාළු, සහ මස් (අමු හෝ වේලන ලද හෝ ලුණු දමන ලද), වියලි මිරිස්, ලූනු, රෙදිපිළි හෝ යම් ඇඳුම් විකිණීම, ඒ සඳහා සභාපතිවරයා විසින් හෝ ඔහුගේ බලය පිට නිකුත් කළ විශේෂ බලපත්‍රයක් නොලත් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම විශේෂ බලපත්‍රයක් ම—

(අ) මෙහිවූ ඇ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති පත්‍රය අනුව විය යුතුය;

(ආ) එහි නිශ්චය කළ හැකි කාල සීමාවක් බල පැවැත්විය යුතුය;

(ඇ) මෙහිවූ ඇ උපලේඛනයෙහි දැක්වෙන ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවූ කල්හි නිකුත් කළ යුතුය.

26. (1) 25 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලබාගත් කිසිවකු සභාපතිගේ ලිඛිත අවසරය නොමැතිව—

(අ) තම බලපත්‍රය වෙනයම් තැනැත්තකුට පැවරීම නොකළ යුතුය; නැතහොත්

(ආ) තමන්ට වෙන්කර දී ඇති වෙළඳ හලින් හෝ ඉඩ ප්‍රමාණයෙන් යම් කොටසක් අතුරු බදු දීම නොකළ යුතුය; නැතහොත්

(ඇ) තම සේවකයා හෝ නියෝජිතයා හැර වෙන යම් තැනැත්තකු විසින් තම වෙළඳ හලින් හෝ ඉඩ ප්‍රමාණයෙන් කොටසක් පාවිච්චි කිරීමට හෝ අල්ලා ගැනීමට අවසර නොදිය යුතුය.

(2) කිසිම තැනැත්තකු විසින් සභාපතිගේ ලිඛිත අවසරය නොමැතිව කර ඇතැයි කියන යම් පැවරීමක් හෝ අතුරු බදු දීමක් යටතේ පොළට අයිති භූමිය ඇතුළත කිසිම වෙළඳ හලක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ අල්ලා ගැනීම නොකළ යුතුය.

(3) සභා කාර්යාලයෙහි තම නම ලියාපදිංචි කර නොමැති කිසිම වෙළඳ සේවකයකු විසින් පොළට අයිති භූමියෙහි යම් වෙළඳ හලක හෝ ඉඩ ප්‍රමාණයක යම් වෙළඳාමකට සහභාගි නොවිය යුතුය.

27. පොළට අයිති භූමිය ඇතුළත උදේ 6 සිට සවස 6 දක්වා වූ කාලය අතරතුර කිසිම තැනැත්තකු විසින්—

(අ) පොළට පැමිණෙන යම් තැනැත්තකුගේ අත බලා ශාස්ත්‍ර කීම හෝ එලාපල කීම හෝ කීමට ඉදිරිපත් වීම නොකළ යුතුය; නැතහොත්

(ආ) බෙහෙත් හෝ ඖෂධ වර්ග ප්‍රචාරය කිරීම, විකිණීම හෝ විකිණීම පිණිස ඉදිරිපත් කිරීම නොකළ යුතුය; නැතහොත්

(ඇ) පොළට අයිති භූමිය තුළ හෝ එය අවට සිට, පොළට පැමිණෙන තැනැත්තන්ගෙන් සිඟමන් ඉල්ලීම නොකළ යුතුය; නැතහොත්

(ඈ) කිසිම ආගමක් ගැන දේශනා පැවැත්වීම, ප්‍රසිද්ධ කථා පැවැත්වීම හෝ පොළට පැමිණෙන තැනැත්තන්ගෙන් සම්මාදම් එකතු කිරීම නොකළ යුතුය; නැතහොත්

(ඉ) යම් කවි කතන්දර, සින්දු හෝ පොත් ප්‍රචාරය කිරීම, කියවීම, ගැයීම හෝ විකිණීම නොකළ යුතුය.

28. පොළෙන් මිලට ගත් භාණ්ඩ කිසිවක් පොළට අයිති භූමිය ඇතුළත දී කිසිම තැනැත්තකු විසින් නැවත විකිණීම නොකළ යුතුය.

29. පොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් 25 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍ර දරන්නන් අතර හෝ එම බලපත්‍ර දරන්නන් හෝ ඔවුන්ගේ සේවකයන් සහ මහජනයා අතර ඇති වන යම් ආරාවුලක් සභාපති විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබ පොළට අයිති භූමියෙහි සේවයෙහි යෙදී සිටින යම් නිලධරයකු විසින් හෝ සභාවේ ආදායම් පරීක්ෂක විසින් බේරුම් කළ හැකිය.

30. පොළට අයිති භූමිය තුළ විනය ආරක්ෂා කිරීම, ඒ සඳහා පත් කරනු ලැබ පොළට අයිති භූමියෙහි සේවයෙහි යෙදී සිටින සභාවේ නිලධරයෙකු විසින් කළ යුතුය.

31. පොළට අයිති භූමිය තුළ ඇතිවන යම් ආරාවුලක් විසඳීමෙහිලා හෝ එහි තුළ විනය ආරක්ෂා කිරීම සඳහා සභාපති විසින් හෝ ඒ සඳහා විධිමත් ලෙස බලය ලත් සභාවේ නිලධරයකු විසින් දෙනු ලබන යම් අණක්, බඩු විකිණීම පිණිස හෝ මිලට ගැනීම පිණිස පොළට පැමිණෙන සියලුම තැනැත්තන් විසින් පිළිපැදිය යුතුය.

32. කිසිම තැනැත්තකු විසින් පොළට අයිති භූමිය ඇතුළත දී පහත සඳහන් දේ නොකළ යුතුය.: —

(අ) ඉවුම් පිහුම් කරගෙන යාම ; හෝ

(ආ) අවිනීත ලෙස හැසිරීම, හෝ යම් ඝෝෂාවක් කිරීම හෝ කෝලාහල කිරීම හෝ බාධා පැමිණවීම හෝ අන්‍යයකු සමග ගහ ගැනීම හෝ අපහාසාත්මක, පරිභව සහගත හෝ අශ්ලීල වචන පාවිච්චි කිරීම ; හෝ

(ඇ) තමාගේ තත්ත්වය සතුටුදායක ලෙස පැහැදිලි කළ නොහැකිව නිකරුණේ කාලය ගතකිරීම හෝ සභාවේ ආදායම් පරීක්ෂක විසින් හෝ ආණ්ඩුවේ නිලධරයකු විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන කිසියම් තැනැත්තකු විසින් පොළට අයිති භූමියෙන් ඉවත් වීමට අණ කරනු ලැබීමෙන් පසු ඉවත් නොවී සිටීම; හෝ

(ඈ) පොළට අයිති භූමිය තුළ තිබෙන වෙළඳ හල්වල යම් කොටසක් හෝ භාණ්ඩ ලාම්පු හෝ සභාවට අයිති වෙනත් දේපල විරූප කිරීම ; හෝ

(ඉ) පොළට අයිති භූමියට යම් බල්ලකු හෝ වාහනයක් ගැනීම.

33. විශේෂ බලපත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින්—

(අ) පොළට පැමිණෙන යම් තැනැත්තකු යම් අපහාසයකට, චිත්ත පීඩාවකට හෝ ප්‍රමාදයකට ගොදුරු නොකළ යුතුය; ;

(ආ) යම් චර්ම, ස්පර්ශ හෝ බෝවෙන රෝගයකින් තමා පෙළෙමින් සිටියදී තම වෙළඳ හලේ, ආසනයේ හෝ ඉඩ කොටසේ රැඳී සිටීම හෝ එහිදී යම් වෙළඳාමකට සහභාගි වීම හෝ එබඳු යම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට එහිදී යම් වෙළඳාමකට සහභාගි වීමට ඉඩ හැරීම නොකළ යුතුය ;

(ඇ) සභාපතිවරයාගේ අවසරය ලියවිල්ලකින් ලබා නොගෙන තමන්ට දී ඇති වෙළඳ හලේ, ආසනයේ හෝ ඉඩ ප්‍රමාණයේ යම් කොටසක් කොටු කිරීම හෝ යම් තිරයක් ඇදීම හෝ වහලක් ඉදිකිරීම නැතහොත් යම් තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීම ඒ වෙළඳ හලේ, ආසනයේ හෝ ඉඩ ප්‍රමාණයේ නොකළ යුතුය ;

(ඈ) සභාවට අයිති දේපළක් නොවන කිසිම පෙට්ටියක්, මේසයක් පුටුවක් හෝ එවැනි වෙනත් ලී භාණ්ඩ සභාපතිවරයාගේ අවසරය නොමැතිව තමන්ගේ වෙළඳ හලට, ආසනයට හෝ ඉඩ ප්‍රමාණයට ගෙන ඒම හෝ එහි තබා ගැනීම නැත හොත් ඒ වෙළඳහලෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි යම් මඩු සෑදීම හෝ වෙනත් උපකරණ සවිකිරීම නොකළ යුතුය;

(ඉ) තමන්ගේ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර නොමැති හෝ සභාව විසින් තහනම් කරනු ලැබූ හෝ අපථ්‍යවූ හෝ කිසි ලෙසකින් මහජන සෞඛ්‍යයට හානිකර වූ යම් භාණ්ඩයක් තම වෙළඳ හලේ, ආසනයේ හෝ ඉඩ ප්‍රමාණයේ ප්‍රදර්ශනය කර හෝ විකිණීම පිණිස තැබීම නොකළ යුතුය.

34. (1) පොළ හා සම්බන්ධ අතුරු ව්‍යවස්ථා කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් 25 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ යම් විශේෂ බලපත්‍රයක් දරන්නකු දෙවැනි වරට හෝ ඉන් පසු වත් වරදකරු කරනු ලැබූ කල්හි ඔහුගේ බලපත්‍රය නිසි බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ කලින් අවලංගු කරන ලද විශේෂ බලපත්‍රයක් දැරූ යම් තැනැත්තකු වෙත 25 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සභාපති විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

(3) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාපති විසින් හෝ ඔහු විසින් විධිමත් ලෙස බලය පවරනු ලැබූ සභාවේ නිලධරයකු විසින් කළ යම් නීත්‍යානුකූල අණක් පිළිපැදීම පැහැර හැර ඇති යම් තැනැත්තකු වෙත අලුත් බලපත්‍රයක් නිකුත් කිරීම සභාපති විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

35. (1) සභාපති විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ යම් නිලධරයකු විසින්, පොළට අයිති භූමිය ඇතුළත විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට ඇති, අපථ්‍ය බව තමාට පෙනී යන, යම් ආහාර ද්‍රව්‍යයක් පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ තහනමට ගනු ලැබූ යම් ද්‍රව්‍යයක් අපථ්‍ය බව රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක, එම ද්‍රව්‍යය තබා ගෙන සිටි තැනැත්තාට වන්දි නොගෙවා එම ද්‍රව්‍යය විනාශ කර දැමිය යුතුය.

36. පොළ පරිපාලනය කිරීම පිණිස සභාපති විසින් පත් කරන ලද යම් නිලධරයකු හෝ තැනැත්තකු විසින් තම යුතුකම් ඉටු කරනවිට ඔහුට විරුද්ධවීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිංසා කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

37. කිසිම තැනැත්තකු විසින්—

(අ) පොළ පවත්වන දිනට පෙර දින සවස 6 ට පෙර පොළට අයිති භූමියෙහි යම් මඩුවක් හෝ වහලක් තැනීම හෝ යම් පැදුරක් හෝ ගෝනියක් තිබීම ; හෝ

(ආ) පොළ පවත්වන දින සවස 6 න් පසු පොළට අයිති භූමියෙහි යම් මඩුවක්, වහලක්, පැදුරක් හෝ ගෝනියක් තැබීම, නොකළ යුතුය.

38. (1) සභාපති විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ වෙනයම් නිලධරයකු විසින් පොළ පවත්වනු ලැබූ දින සවස 6 න් පසු පොළට අයිති භූමියෙහි තිබෙන යම් මඩුවක් හෝ වහලක් කඩා දැමීම හා යම් පැදුරක් හෝ ගෝනියක් හෝ යම් භාණ්ඩයක් ඉවත් කිරීමද නීත්‍යානුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය අනුව කරනු ලබන යම් ක්‍රියාවක් හේතුකොට ගෙන සිදුවන පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් වන්දි ලැබීමට කිසිම තැනැත්තකු හිමිකම් නොලැබිය යුතුය.

39. 24 සිට 38 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවලින් යමක් විෂයෙහි ලා කෙරෙන සෑම උල්ලංඝනයක්ම රුපියල් දෙසිය පනහකට වැඩි නොවූ දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදක් විය යුතු අතර උල්ලංඝනය දිගින් දිගට කෙරෙන අවස්ථාවක, නිසි බලය ලත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කැරවෙන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ ඔහු බලය පැවරූ නිලධරයකු විසින් භාර දෙනු ලැබීමෙන් පසු, උල්ලංඝනය දිගින් දිගට කෙරෙන සෑම දවසකටම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින් ද දඬුවම් ලැබිය යුතුය.

40. 3 සිට 23 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පොළට අදාළ නොවිය යුතුය.

## " ඇ " උපලේඛනය

### විශේෂ බලපත්‍ර ආකෘතිය

(ඉදිරිපස)

අංකය : දිනය :

**කෑගලු නගර සභාව**

කෑගලු නගර සභාවේ සභාපති තැන්පත්..........................වන මම..........................පදිංචි..........................මහතාට කෑගලු පොළට අයිති භූමියෙහි ඔහුට වෙන් කර දී ඇති වෙළඳ හලෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි..........................විකිණීමට හෝ විකිණීම පිණිස තබා ගැනීමට මෙයින් බලය පවරමි.

මෙම බලපත්‍රය..........................තෙක් වලංගුව පැවතිය යුතු අතර, එය කෑගලු පොළට අදාළ අතුරු ව්‍යවස්ථාවලට සහ එහි පිටුපස දැක්වෙන කොන්දේසි වලට යටත්ව නිකුත් කරන ලදී.

————————,
සභාපති.

(පිටුපස)

**(මෙහි අනික් පිටුවෙහි සඳහන් කොන්දේසි)**

(1) මෙම බලපත්‍රය අන් සතු කළ නොහැකිය.

(2) මෙම බලපත්‍රය සභාපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධාරියකු හෝ නගර සභාවේ ආදායම් පරීක්ෂක විසින් ඉල්ලූ විට ඉදිරිපත් කළ යුතුය.

(3) කෑගලු පොළට අදාළ අතුරු ව්‍යවස්ථා කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවෙනි වරට හෝ ඉන්පසුවත් බලපත්‍ර දරන්නා වරදකරු කරනු ලැබූ කල්හි මෙම බලපත්‍රය අවලංගු කිරීමට යටත් වේ.

## " ඇ " උපලේඛනය

**කුලී ප්‍රමාණ**

විශේෂ බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ, ඉඩ ප්‍රමාණයකදී හෝ වෙළඳ හලකදී විකිණීම සඳහා වූ අවස්ථාවක—

| එළිමහන් ඉඩ ප්‍රමාණ | දිනකට හෝ ඉන් කොටසකට කුලිය |
|---|---|
| | රු. ශ. |
| (අ) වශී අඩි 10 කට වැඩි නොවූ ... | 0 25 |
| (ආ) වශී අඩි 10 කට වැඩි එහෙත් වශී අඩි 15 කට අඩු ... ... | 0 50 |
| (ඇ) වශී අඩි 15 කට වැඩි එහෙත් වශී අඩි 32 කට අඩු ... ... | 0 75 |
| (ඈ) වශී අඩි 32 කට වැඩි, එහෙත් වශී අඩි 60 කට අඩු ... ... | 1 00 |
| (ඉ) වශී අඩි 60 කට වැඩි නම් රු. 1.00 සහ ඊට වැඩි වන සෑම වශී අඩියකටම ශත 05 බැගින් | |
| (වෙළඳ හල්) | |
| (ඊ) එක් එක් වෙළඳ හලක් සඳහා ... | 2 50 |

3–482—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—. 28/68.

### ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ කාක්කාපල්ලිය ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

කොප්පරා සෑදීම.
උපකරණ මගින් තෙල් හිඳීම.
කබොක් ගල් හෝ බොරළු හෝ කළුකල් හෝ ලබාගැනීමට වලවල් කැනීම.
කොප්පරා ගබඩා කිරීම.
පිදුරු ගබඩා කිරීම.
කපාපු පොල් නිෂ්පාදනය කිරීම.
වලක් කැනීමෙන් හිරිගල් ලබා ගැනීම.
හුණු පෝරණයක් තබා ගැනීම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම.
අම්ලකර පෑස්සීම් කෙරෙන කම්හලක් තබා ගැනීම.
ලී මඩුවක් තබා ගැනීම.
ස්වර්ණාභරණ සෑදීම.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
හාල් මෝලක් තබා ගැනීම.
සෙක්කුවල ආධාරයෙන් පොල්තෙල් හිඳීම.
මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය, කුළුබඩු හෝ වෙනත් මෑ වර්ග යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම.
මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා ගරාජයක් පවත්වාගෙන යාම.
ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
ගෘහ භාණ්ඩ නිපදවීම.
ලී ඉරුම්වලක් පවත්වාගෙන යාම.
ලී මෝලක් පවත්වාගෙන යාම.
දර මඩුවක් පවත්වාගෙන යාම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
කොම්පෝස්ට් පොහොර හෝ කෘතිම පොහොර සෑදීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
පුවක් වියලා සකස් කිරීම.
ලේ සහ අවමස් උණු කිරීම.
ඇටකටු ගබඩා කිරීම.
මාළු අයිස් දැමීම.
බීඩි සෑදීම.
ලෑලි පොහවා සකස් කිරීම.
පැණි සෑදීම.
කෝඩා සෑදීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
පොල් ලෙලි පෙඟවීම පිණිස ලෙලි වලක් පවත්වාගෙන යාම.
තීන්ත හෝ වාර්නිස් ගබඩා කිරීම.
ගිනි ගෝනි මලු ගබඩා කිරීම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්ත්‍රාදායක ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

කෙඳි වර්ග සායම් කිරීම.
ගඩොල් හෝ උළු පිළිස්සීම.
බැටරි පිරවීම.
හුණුගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

3–472—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—බී. 14/64.

### පැල්මඩුල්ල සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ, පැල්මඩුල්ල සුළු නගර සභාව මගින් සම්පාදනය කරන ලදුව එම ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 1.

### අතුරු ව්‍යවස්ථා

**තාවකාලික ගොඩනැගිලි**

1. සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් මගින් ලබාගත් බලය මත මිසක කිසිම තැනැත්තකු විසින් සභාවේ පාලන සීමාව තුළ කිසිම් තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ඉදිකරවීම නොකළ යුතුය.

2. 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබා ගැනීමට බලාපොරොත්තු වන සෑම තැනැත්තකු විසින්ම ඒ සඳහා සභාපතිවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලුම් පත්‍රයෙහි—

(අ) යෝජිත තාවකාලික ගොඩනැගිල්ල ඉදිකිරීමට බලාපොරොත්තු වන ස්ථානය ;

(ආ) ගොඩනැගිල්ලේ ස්වභාවය සහ ප්‍රමාණය ;

(ඇ) අවසර පත්‍රය වුවමනා කරන කාලසීමාව ; සහ

(ඈ) තාවකාලික ගොඩනැගිල්ල පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන කාය්‍යීය සඳහන් කළ යුතුය.

3. (අ) තාවකාලික ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජනා කර ඇති භූමිය එය අසල ප්‍රදේශයේ මනෝඥත්වය හා සැපපහස කම්වලට බාධාවන අයුරු පිහිටා ඇත්තේ නම්; හෝ

(ආ) එම භූමිය බස්, බර කරත්ත, කරත්ත හෝ කුලීකාර් නවතන පොදු නැවතුම්පලක් වශයෙන් දැනටමත් ප්‍රයෝජනයට ගැනේ නම්; හෝ

(ඇ) තාවකාලික ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරන කාර්යය යම් ආකාරයක පීඩාවක් ඇති කිරීමට ඉඩ තිබිය හැකිනම්; හෝ

(ඈ) තාවකාලික ගොඩනැගිල්ල බලය නොලත් වෙළඳාමක් සඳහා පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන්නේ නම්; හෝ

(ඉ) එම ගොඩනැගිල්ල යම් මංමාවතකට කිසියම් ආකාරයේ වූ අවහිරයක් හෝ මංමාවත් භූමියෙන් අයුතු ඇඳාගැනීමක් සිදු කරන්නේ නම්

1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

4. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයකටම මෙහි වූ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

5. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ තාවකාලික ගොඩනැගිල්ලක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන සභාපතිවරයා හෝ නිලධාරියා විසින් එම අවසර පත්‍රයෙහි, තාවකාලික ගොඩනැගිල්ල තබා ගැනීමට අවසර දී තිබෙන කාල සීමාව නිශ්චය වශයෙන් සඳහන් කළ යුතුය.

6. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයකින් ලබාගන්නා ලද බලය උඩ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකරන්නාවූ හෝ ඉදිකරවන්නාවූ සෑම තැනැත්තකු විසින්ම, එම අවසර පත්‍රයෙහි නිශ්චය කර ඇති කාලසීමාව ඉක්ම ගිය පසු එම තාවකාලික ගොඩනැගිල්ල කඩාදැමීම හෝ කඩාදැම්මවීම කළ යුතුය.

7. 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයකම එම අවසර පත්‍රය නිකුත් කර ඇති කොන්දේසි සභාපතිවරයා විසින් නිශ්චය වශයෙන් සඳහන් කළ හැකිය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවන් කිසිවක් හෝ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන, යම් අවසර පත්‍රයක නිශ්චය කර ඇති යම් කොන්දේසියක් හෝ උල්ලංඝනය කිරීම එබඳු සෑම විටකම රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත්විය යුතු වරදක් විය යුතු අතර දිගටම උල්ලංඝනය කිරීමේදී එසේ සුදුසු බලය ලත් අධිකරණයක් මගින් වරදකරු කළ පසුවත් උල්ලංඝනය කර ගෙන යනු ලබන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් විසිපහක අතිරේක දඩයකටද යටත්විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවන් හි—

"සභාපති" යන්නෙන් සුළු නගර සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් පැල්මඩුල්ල සුළු නගර සභාව අදහස් වේ.

"ආඥපනත" යන්නෙන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනත අදහස් වේ.

"තාවකාලික ගොඩනැගිල්ල" යන්නට ගෙනයාහැකි වේදිකාවක්, ගැලවිය හැකි රාක්කයක්, ඇන්දක් හෝ පියස්සක් සවිකළ වේදිකාවක්, තාවකාලිකව හෝ ස්ථිරව පොළවට සවිකළ රඳනයක් මත ඇති පියස්සක් හෝ විතානයක් හෝ රෝද මත සවිකරන ලද ගෙනයා නොහැකි කොයිම අන්දමේ වුවද ඉදිකිරීමක් ඇතුළත් වේ.

"මංමාවත්" යන්නට ආඥපනතෙහි ඇති අර්ථයම යෙදෙන්නේ ය.

### උපලේඛනය

| | ගාස්තු |
|---|---|
| අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන කාලසීමාව— | රු. ශ. |
| (අ) මාසයකට වැඩි නොවේනම් ... ... | 2 0 |
| (ආ) මාසයකට වැඩිවේ නම් ... ... | 10 0 |

3–463—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## නාත්තන්ඩිය සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 සහ 156 යන වගන්ති යටතේ, නාත්තන්ඩිය සුළු නගර සභාව මගින් සම්පාදනය කරන ලදුව යථෝක්ත ආඥපනතේ 153 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

### තාවකාලික ඉදිකිරීම්

1. තත් කාරණය සඳහා සභාපති විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් උඩ විනා, සභා සීමාව තුළ යම් මාවතක කිසිවකු විසින් කිසිදු තාවකාලික ඉදිකිරීමක් කිරීම හෝ කරවීම නොකළ යුතුය.

2. 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබාගැනීමට බලාපොරොත්තු වන සෑම තැනැත්තකු විසින් ඒ සඳහා සභාපති වෙත ඉල්ලුම් කළයුතු අතර, ඒ ඉල්ලුම් පත්‍රයෙහි—

(අ) යෝජිත තාවකාලික ගොඩනැගිල්ල ඉදිකිරීමට බලාපොරොත්තු වන ස්ථානය;

(ආ) ගොඩනැගිල්ලේ ස්වභාවය සහ ප්‍රමාණය;

(ඇ) අවසර පත්‍රය වුවමනා කරන කාලසීමාව; හා

(ඈ) තාවකාලික ගොඩනැගිල්ල පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන කාර්යය සඳහන් කළ යුතුය.

3. (අ) තාවකාලික ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජනා කර ඇති භූමිය අසල ප්‍රදේශයේ සැප පහසුකම්වලට බාධාවන අයුරු එය පිහිටා ඇත්තේ නම්; හෝ

(ආ) එම භූමිය බස්, තිරික්කල, කරත්ත හෝ කුලී කාර් නවතන පොදු නැවතුම්පලක් වශයෙන් දැනටමත් ප්‍රයෝජනයට ගැනේ නම්; හෝ

(ඇ) තාවකාලික ගොඩනැගිල්ල ප්‍රයෝජන ගැනීමෙන් යම් ආකාරයක පීඩාවක් සිදුවීමට ඉඩතිබේ නම්; හෝ

(ඈ) තාවකාලික ගොඩනැගිල්ල බලය නොලත් වෙළඳාමක් සඳහා පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන්නේ නම්; හෝ

(ඉ) එම ගොඩනැගිල්ල කවර හෝ මාවතකට අවහිර පමුණුවන්නේ නම් හෝ නීතිවිරෝධී අන්දමට එම මංමාවත්වලින් භූමි ප්‍රමාණයක් ඇඳාගන්නේ නම්

එවැනි තාවකාලික ඉදිකිරීමක් සඳහා 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බල පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

4. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සඳහාම මෙහිවූ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

5. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ තාවකාලික ගොඩනැගිල්ලක් සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබන සභාපති විසින් හෝ වෙනත් නිලධාරියකු විසින් තාවකාලික ගොඩනැගිල්ල තබා ගත හැකි කාල සීමාව එම බලපත්‍රයෙහි නියමකර සඳහන් කළයුතුය.

6. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගන්නා ලද බලපත්‍රයක් උඩ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ ඉදි කරවන සෑම අයෙකු විසින්ම, බලපත්‍රයේ නියමකර ඇති කාල සීමාව ඉක්ම ගිය පසු එම තාවකාලික ගොඩනැගිල්ල කඩා දැමීම හෝ නැති නම් එය කඩා දැම්මවීම කළ යුතුය.

7. 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම නිකුත් කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි සභාපතිවරයා විසින් එම බල පත්‍රයේ නිශ්චිතව සඳහන් කළ හැකිය.

8. මෙහි යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක නියම කර ඇති යම් කොන්දේසියක් හෝ උල්ලංඝනය කරනු ලැබීම රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු වරදක් වන අතර, එසේ සුදුසු උසාවියක් මගින් වරදකරු කළ පසුවත් උල්ලංඝනය කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් විසිපහක අතිරේක දඩයකටද යටත් විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවන් හි—

"සභාපති" යනුවෙන් සුළු නගර සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් නාත්තන්ඩිය සුළු නගර සභාව අදහස් වේ.

"ආඥපනත" යනුවෙන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනත අදහස් වේ.

" තාවකාලික ගොඩනැගිල්ල " යන්නට ගෙනයා හැකි වේදිකාවක්, ගැලවිය හැකි රාක්කයක්, ඇන්දක් හෝ පියස්සක් සවිකළ වේදිකාවක්, තාවකාලිකව හෝ ස්ථිරව පොළවට සවි කළ රඳනයක් මත ඇති පියස්සක් හෝ විතානයක් හෝ රෝද මත සවිකරන ලද ගෙනයා නොහැකි යම් ඉදිකිරීමක් ඇතුළත් වේ.

" මංමාවත් " යන්නෙහි අර්ථය ආඥපනතෙහි ඊට දී ඇති අර්ථය ම වේ.

උපලේඛනය

| | ගාස්තු |
|---|---|
| බලපත්‍රය නිකුත් කරනු ලබන කාලසීමාව— | රු. ශ. |
| (අ) මාසයකට වැඩි නොවේ නම් ... | 0 50 |
| (ආ) මාසයකට වැඩිවන විට එසේ වැඩි වන සෑම මාසයකටම හෝ ඉන් කොටසකට ... | 0 50 බැගින් |

3–464—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 85/44.

## මාතර නගර සභාව—නගර සභා ආඥපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ මාතර නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥපනතේ අංක 154 වන වගන්තියෙන් පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු 4,
කොළඹ දී ය.

### අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයන්ට අදාළ වූ අතුරු ව්‍යවස්ථාව

පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

ඔසවනයක් තිබෙන මෝටර් රථ සර්විස් කිරීමේ ස්ථානයක් තබා ගැනීම.

මෝටර් බයිසිකල් අලුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.

පැට්රල් පිරවීමේ ගබඩාවක් පවත්වා ගෙන යෑම.

ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යෑම.

ලියවන පට්ටලයක් සහ කම්මල් ලිපක් සහිතව ගිනියම් කර පෑස්සීමේ යන්ත්‍රයක් තිබෙන්නාවූ මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වා ගෙන යෑම.

කම්මල් ලිපක් සහිතව ගිනියම් කර පෑස්සීමේ යන්ත්‍රයක් තිබෙන්නාවූ මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ වැඩ පොළක් පවත්වා ගෙන යෑම.

කම්මල් ලිපක් තිබෙන මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ වැඩ පොළක් පවත්වාගෙන යෑම.

ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ වැඩ පොළක් පවත්වා ගෙන යෑම.

ටයර් සහ ටියුබ් වොල්කනයිස් කිරීමේ වැඩ පොළක් පවත්වා ගෙන යෑම.

බැටරි පිරවීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

මිනී පෙට්ටි සෑදීම සහ ගබඩා කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ ගබඩා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

වඩු කර්මාන්ත වැඩපළක් පවත්වා ගෙන යෑම.

කිසියම් වර්ගයක යන්ත්‍ර පාවිච්චියට ගනු ලබන ලී ඉරණ මෝලක් පවත්වා ගෙන යෑම.

බෙලෙක් වැඩ පොළක් පවත්වා ගෙන යෑම.

මුද්‍රණාලයක් පවත්වා ගෙන යෑම.

ලී ගබඩා කර තැබීම සඳහා ගබඩාවක් හෝ අංගනයක් පවත්වා ගෙන යෑම.

දර ගබඩා කර තැබීම සඳහා ගබඩාවක් හෝ අංගනයක් පවත්වා ගෙන යෑම.

ගැලුම් 1000 ඉක්ම වන ගබඩා ධාරිතාවක් තිබෙන භූමිතෙල් ගබඩාවක් පවත්වා ගෙන යෑම.

ගැලුම් 1000 ඉක්මවන ගබඩා ධාරිතාවක් තිබෙන ඩීසල් තෙල් ගබඩාවක් පවත්වා ගෙන යෑම.

පොල් ලෙලි පෙඟවීම සඳහා වර්ග අඩි 100 ට වැඩි පොල් ලෙලි වළක් තබා ගැනීම.

මාළු ජාඩි ලෑම හෝ කරවල ලෙස වේලීම හෝ අයිස් දැමීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

හාල් කෙටීම, පෙලීම සහ නිවුඩු හැරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

මිරිස් සහ තුනපහ ඇඹරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

කම්මලක් හෝ කම්මල් ලිපක් පවත්වා ගෙන යෑම.

ස්වර්ණාභරණ සෑදීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

විදුලි කර්මාන්ත වැඩ පොළක් පවත්වා ගෙන යෑම.

කුරුඳු ගබඩා කිරීම.

පැඟිරි තෙල් ගබඩා කිරීම.

සිමෙන්ති කොට්ට 100 ට වඩා ගබඩා කිරීම.

පේන්ට් සහ වාර්නිෂ් ගබඩා කිරීම.

පුනක්කු හෝ වෙනත් සත්ව ආහාර රාත්තල් 100 ට වඩා ගබඩා කිරීම.

දුම්කොළ මිටි හෝ සිප්පත් 20 ට වඩා ගබඩා කිරීම.

ගිස් බෝතල් ගබඩා කිරීම.

ගිස් ගෝනි ගබඩා කිරීම.

පැරණි ලෝහ ගබඩා කිරීම.

තොග වශයෙන් විකිණීම පිණිස තරක් වන සුළු ආහාර වර්ග ගබඩා කිරීම.

ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම.

මෙතිල්කෘත හා ස්ප්‍රීතු ගබඩා කිරීම.

අඟුරු ගබඩා කිරීම.

කපු හෝ කොට්ට පුළුන් ගබඩා කිරීම.

සත්වයින්ගේ හම් සහ කටු ගබඩා කිරීම.

හුණු සහ හුණු ගල් ගබඩා කිරීම හෝ පිලිස්සීම.

සබන් සෑදීම.

ක්‍රේප් රබර් සහ ෂීට් රබර් නිෂ්පාදනය කිරීම.

යන්ත්‍ර මාර්ගයෙන් තේ සෑදීම.

විනාකිරි සෑදීම.

යන්ත්‍ර මගින් පොල් තෙල් සිඳීම.

කපෑපු පොල් සෑදීම.

කොප්පරා සෑදීම.

සුරුට්ටු සෑදීම.

බීඩි සෑදීම.

කෘත්‍රිම පොහොර සෑදීම.

රෙදි ඩයි දැමීමේ සහ ඩ්‍රයි ක්ලීන් කිරීමේ ආයතනයක් පවත්වා ගෙන යෑම.

ලෑලි පොගවා සකස් කිරීම.

යන්ත්‍ර මගින් ගල් කෑඩීම.

කබුක් ගල්, බොරළු හෝ කළු ගල් ලබා ගැනීමට ගල් වලවල් නැතීම.

යන්ත්‍ර මාර්ගයෙන් කෙඳි වශී හෝ කොහු ලණු නිෂ්පාදනය කිරීම.

පැණි ගබඩා කිරීම.

3–445—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී. 41/69

## ගම්සභා ආඥාපනත

(257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වෙනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 1 වන දින,
කොළඹ දී ය.

### අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර හා අදාළ

### අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(අ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම
(ආ) නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය හා කුළුබඩු තොග වශයෙන් විකිණීම සඳහා ගබඩා කිරීම
(ඇ) විනාකිරි නිපදවීම
(ඈ) සබන් නිපදවීම
(ඉ) හම් පදම්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම
(ඊ) හම් ගබඩා කිරීම
(උ) ඇටකටු ගබඩා කිරීම
(ඌ) පැණි හෝ හකුරු නිපදවීම
(එ) රා එක් රැස් කිරීමේ ස්ථානයක් තබාගැනීම
(ඒ) බීඩි නිපදවීම
(ඔ) යකඩ බඩු ගබඩාවක් පවත්වාගෙන යාම
(ඕ) හොණ්ඩර 100 කට වැඩි ප්‍රමාණයක සිමෙන්ති ගබඩා කිරීම
(ක) දුම්කොළ ගබඩා කිරීම.

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(අ) කොප්පරා නිපදවීම
(ආ) කබොක්, බොරළු හෝ කළුගල් හෑරීම
(ඇ) කොප්පරා ගබඩා කිරීම
(ඈ) පිදුරු ගබඩා කිරීම
(ඉ) ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම
(ඊ) ස්වර්ණාභරණ සෑදීම
(උ) යකඩ කම්හලක් පවත්වාගෙන යාම
(ඌ) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
(එ) අම්ලකර වායුව පාවිච්චි කරන යකඩ කම්හලක් පවත්වාගෙන යාම
(ඒ) වී කොටන මෝලක් හෝ පාශින යන්ත්‍රයක් පවත්වාගෙන යාම
(ඔ) සිසිල් බීම නිපදවීම
(ඕ) කළුගල් පිපිරවීම
(ක) මිරිස්, කෝපි, පිටි, වෙනත් ධාන්‍ය වර්ග හෝ කුළුබඩු හෝ වෙනත් වර්ගවල ඇට අඹරන ස්ථානයක් පවත්වාගෙන යාම
(ග) විදුලි උපකරණ හෝ රේඩියෝ අලුත්වැඩියා කිරීමේ සාප්පුවක් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
(ජ) ඛිස් යෝනි මළු ගබඩා කිරීම
(ට) ටයර් හෝ ටියුබ් වල්කනයිසින් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
(ඩ) බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
(ණ) බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
(ත) වඩුවැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
(ද) ගෘහභාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
(න) ගෘහභාණ්ඩ විකිණීම සඳහා සාප්පුවක් පවත්වාගෙන යාම
(ප) දර මඩුවක් පවත්වාගෙන යාම
(බ) දර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
(ම) පෑස්සීම් හෝ අම්ලකර පෑස්සීම් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
(ය) යාන්ත්‍රික බලය පාවිච්චි නොකර මෝටර් වාහන අලුත්වැඩියා කරන හෝ සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
(ර) හුණු හෝ හුණු ගල් ගබඩා කිරීම
(ල) තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(අ) යන්ත්‍රානුසාරයෙන් ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් සෑදීම සහ දුම්ගැස්වීම
(ආ) අත් යන්ත්‍රානුසාරයෙන් රබර් සෑදීම සහ දුම් ගැස්සීම
(ඇ) යන්ත්‍රානුසාරයෙන් හෝ අත් යන්ත්‍රානුසාරයෙන් රබර් සෑදීම හෝ දුම් ගැස්වීම
(ඈ) කෘත්‍රිම පෝර හෝ කෘත්‍රිම පෝර සෑදීමට ගනු ලබන ද්‍රව්‍ය ගෝනි තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
(ඉ) ගඩොලු හෝ උළු නිපදවීම හෝ පිළිස්සීම
(ඊ) බැටරි චාජ් කිරීම
(උ) හුණුගල් පිළිස්සීම, රැස්කිරීම, වේලීම හා කැබලිවලට කැඩීම
(ඌ) මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම
(එ) හුණු පෝරණුවක් පවත්වාගෙන යාම
(ඒ) යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැබලි කිරීම.

3–466—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

එල්. සී.—බී. 14/52.

## රත්නපුර මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වැනි සහ 272 වැනි වගන්තිය යටතේ රත්නපුර මහ නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාව.

1969.12.19 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1960 සැප්තැම්බර් මස 30 දින 12,207 දරන ගැසට් නිවේදනයෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද, 1927 නොවැම්බර් මස 11 දින අංක 7,614 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද බලපත්‍ර පිළිබඳ පොදු අතුරු ව්‍යවස්ථාවල පළමුවෙනි අතුරු ව්‍යවස්ථාවේ "පද සම්බන්ධ අර්ථ නිරූපණය" යන ශීර්ෂය යටතේ "අප්‍රසන්න හෝ අන්තරාදායක ව්‍යාපාර" යන්නෙහි අර්ථ නිරූපණයේ "වඩුමඩුවක් තබාගැනීම" යන්න වෙනුවට පහත සඳහන් වචන ඇතුළත් කිරීමෙන් ඒවා තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"වඩු මඩුවක් තබා ගැනීම.
කම්හලක් තබා ගැනීම.
රෙදි මෝලක් තබාගැනීම.
ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම.
රෙදිපිළි සායම් කරන ස්ථානයක් තබා ගැනීම.
බෙලෙක් වැඩ පළක් පවත්වාගෙන යාම.
බැටරි පිරවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම,
අයිස්ක්‍රීම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
රථවාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
ලාම්පු තෙල් ගබඩා කිරීම.
ඩීසල් තෙල් ගබඩා කිරීම.
වයින් ස්ප්‍රීට් ගබඩා කිරීම.
හිස් බෝතල් ගබඩා කිරීම.
අයිස්ක්‍රීම් සෑදීම.
වෙළඳාම සඳහා ලි බඩු වර්ග සෑදීම හෝ ගබඩා කිරීම,
වෙළඳාම සඳහා මිනිපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.
රබර් බඩු සෑදීම.
ඔට්ටපාලු වේලීම හෝ ඇඹරීම.
බොරළු සඳහා වළවල් කැණීම.
කබොක් කැපීම සඳහා වළවල් කැණීම.
සුරුට්ටු සෑදීම.
රබර් ගබඩා කිරීම.
වෙළඳාම පිණිස සිමෙන්ති හොණ්ඩර 25 කට වඩා ගබඩා කිරීම.
වෙළඳාම පිණිස යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීම.
ඡායාරූප ශාලාවක් තබා ගැනීම".

3–461—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 මාර්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය** | | |
| **මොරටුව නගර සභාව** | | |
| 9 | ... | කුමාරසිංහ ආරච්චිගේ දොන් ලොරේන් විවියන් ලෙනාර්ඩ් පීරිස් |
| **මහනුවර දිස්ත්‍රික්කය** | | |
| **උඩුනුවර ගඟපළාත දකුණ ගම්සභාව** | | |
| 12 | ... | රත්නායක මුදියන්සෙලෑ ජයවීර |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | |
| **රත්නපුර මහා නගර සභාව** | | |
| 9 | ... | විජයසූරිය ගුණවර්ධන මහවඩුගේ ඇල්බට් පෙරේරා |
| **රක්වාන සුළු නගර සභාව** | | |
| 1 | ... | වහුම්පුරගේ සිමියොන් |
| **කුරුවිට ගම් සභාව** | | |
| 19 | ... | කරඳන මුහන්දිරමලාගේ හීන් මහත්මයා |

3–452—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## තිස්සමහාරාම සුළු නගර සභාව

### ආදයම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය—1968

**ආදයම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... | 1,16,386 60 | |
| බී—මංමාවත් ... ... | 1,438 0 | |
| සී—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 8,203 54 | |
| ඩී—මහජන සෞඛ්‍යය ... ... | 46,623 17 | |
| ඊ—මහජන විනෝද ... ... | 9,197 60 | |
| එප්—සුසාන භූමි ... ... | — | |
| ජී—සුනඛයින් ලියා පදිංචිය ... | 1 0 | |
| එච්—කිරුම් හා මිණුම් ... ... | — | |
| අයි—ගින්නෙන් ආරක්ෂා කිරීම ... | — | |
| ජේ—කියවීම් ශාලා සහ පුස්තකාල ... | 63 80 | |
| | | 1,81,913 71 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් ... ... | 48,342 19 | |
| 2. අත්තිකාරම් ... ... | 9,751 51 | |
| 3. විවිධ ණය හිමියෝ | 8,805 98 | |
| 4. ණය මුදල් (දේ.ණ.සහ ස.අ.) ... | 20,000 0 | |
| 5. විදුලි ගිණුම ... ... | 91,471 58 | |
| 6. විවිධ ණය ගැතියෝ... ... | 29,481 92 | |
| 7. විදුලි දෙපාර්තමේන්තුවේ අගය අඩුවීමේ සංචිතය | 1,000 0 | |
| 8. පොදු වෙළඳපොල බදු ... | 19,000 80 | |
| 9. අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) | 433 37 | |
| 10. අධිකතා හා ඌණතා ගිණුම (විදුලිය)... | 164 64 | |
| 11. ආදයම් එකතුකිරීමේ ගිණුම : | | |
| (ඒ) දේපොල බදු ... ... | 27,241 72 | |
| (බී) ජලබදු ... ... | 7,863 21 | |
| (සී) වැසිකිළි බදු ... ... | 4,410 0 | |
| (ඩී) කුලී ... ... | 7,010,10 | |
| (ඊ) පෞද්ගලික ජල බදු | 2,954 50 | |
| (එප්) වරිපනම් දඩ මුදල් ... | 786 67 | |
| (ජී) විදුලිබල ගාස්තු ... ... | 72,363 52 | |
| | | 3,51,081 71 |
| 1967.12.31 වැනි දිනට ඉතිරි මුදල් ... | | 95,360 30 |
| | | 6,28,355 72 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 60,079 80 | |
| බී—මංමාවත් ... ... | 29,037 77 | |
| සී—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 12,892 79 | |
| ඩී—මහජන සෞඛ්‍යය ... ... | 77,042 63 | |
| ඊ—මහජන විනෝද ... ... | 1,270 0 | |
| එප්—සුසාන භූමි ... ... | — | |
| ජී—සුනඛයින් ලියාපදිංචිය ... ... | — | |
| එච්—කිරුම් හා මිණුම් ... ... | — | |
| අයි—ගින්නෙන් ආරක්ෂා කිරීම ... | — | |
| ජේ—කියවීම්ශාලා සහ පුස්තකාල ... | 5,898 56 | |
| | | 1,86,221 55 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් ... ... | 46,577 69 | |
| 2. අත්තිකාරම ... ... | 9,771 56 | |
| 3. විවිධ ණය ගැතියෝ ... ... | 25,534 76 | |
| 4. ණය මුදල් (දේ.ණ. සහ ස.අ.) ... | 250 0 | |
| 5. විදුලි ගිණුම ... ... | 1,45,854 34 | |
| 6. විවිධ ණය හිමියෝ ... ... | 12,987 97 | |
| 7. ස්ථිර තැන්පත් (විදුලි දෙපාර්තමේන්තුවේ අගය අඩුවීමේ සංචිතය) ... | 9,250 0 | |
| 8. පොදු වෙළඳපොල බදු ... | 19,000 80 | |
| . අධිකතා ඌණතා ගිණුම (සාමාන්‍ය) ... | 550 0 | |
| 10. අධිකතා ඌණතා ගිණුම (විදුලිය) ... | — | |
| 11. ආදයම් එකතුකිරීමේ ගිණුම : | | |
| (ඒ) දේපොල බදු ... ... | 29,042 10 | |
| (බී) ජල බදු ... ... | 8,596 94 | |
| (සී) වැසිකිළි බදු ... ... | 3,580 0 | |
| (ඩී) කුලී ... ... | 7,644 0 | |
| (ඊ) පුද්ගලික ජල බදු ... ... | 7,121 0 | |
| (එප්) වරිපනම දඩ ... ... | 775 82 | |
| (ජී) විදුලි බල ගාස්තු ... ... | 70,432 52 | |
| | | 3,96,969 50 |
| | | 5,83,191 05 |
| 1968.12.31 වැනි දිනට ඉතිරි මුදල් ... | | 45,164 67 |
| | | 6,28,355 72 |

තිස්සමහාරාම සුළු නගර සභාවේ සභාපති වන ගාර්දියෙ වසම් තුයිය හැන්නැදිගේ ආර්ලිස් සිල්වා වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 වර්ෂයේ තිස්සමහාරාමය සුළු නගර සභාවේ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත්, වාර්තාවක් බව සහතික කරමි.

ජී. ටී. ආර්ලිස් සිල්වා,
සභාපති,
තිස්සමහාරාම සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරන ලදී.
කේ. පී. පීටර් සිල්වා,
සභික.

1969 නොවැම්බර් මස 13 වැනි දින මා ඉදිරි පිට තිස්සමහරාමයේදී සහතික කරන ලදී.
ඊ. ජයසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන.

## තිස්සමහරාම සුළු නගර සභාව

### 1968 දෙසැම්බර් 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් : | | | |
| රජයේ ආධාර (නිවාස යෝජනා ක්‍රමය) | | 16,500 0 | |
| රජයේ ආධාර (අළුත්ගොඩ මැදවලාන පාර) | | 5,500 05 | |
| රජයේ ආධාර (ක්‍රීඩා පිටිය) | | 5,000 0 | |
| රජයේ ආධාර (පුස්තකාලය) | | 410 54 | |
| සාමාන්‍ය තැන්පත් ... | | 42,470 33 | |
| | | | 69,880 92 |
| විවිධ ණය හිමියෝ ... | | | 9,117 33 |
| දේශිය ණය සංවර්ධන අරමුදල ණය ඉතිරි | | | 20,007 30 |
| විදුලි දෙපාර්තමේන්තුවේ අගය අඩුවීමේ සංචිතය (ස්ථිර තැන්පත්) | | | 9,250 0 |
| විදුලි දෙපාර්තමේන්තුවේ අගය අඩුවීමේ සංචිතය (වර්ෂයේ ප්‍රතිපාදනය) | | | 1,000 0 |
| අධිකතා ඌණතා ගිණුම (සාමාන්‍ය) | | | |
| 1968.1.1 දිනට අධිකය ... | | 60,464 84 | |
| 1968 වර්ෂයේ සකස් කිරීම්–බැර | | 433 37 | |
| | | 60,898 21 | |
| 1968 වර්ෂයේ සකස්කිරීම්–හර | | 550 0 | |
| | | 60,348 21 | |
| 1968 වර්ෂයේ වැය ... | 1,86,221 55 | | |
| 1968 වර්ෂයේ අය ... | 1,81,913 71 | | |
| 1968 වර්ෂයේ අයට අධික වැය | | 4,307 84 | |
| 1968.12.31 වැනි දිනට අධිකය | | | 56,040 37 |
| | | | 1,65,295 92 |

**වත්කම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... | | | 4,219 22 |
| දේපොල බදු ... | | | 15,598 12 |
| ජල බදු ... ... | | | 4,138 45 |
| වැසිකිළි බදු ... | | | 975 0 |
| කුලී ... ... | | | 914 0 |
| පුද්ගලික ජල බදු ... | | | 5,459 0 |
| විවිධ ණය ගැතියෝ ... | | | 27,177 04 |
| වරිපනම් දඩ මුදල් ... | | | 505 64 |
| විදුලි බල ගාස්තු ... | | | 12,126 60 |
| ස්ථිර තැන්පත් මහජන බැංකුව (වි.දෙ.අ.අ. සංචිතය) | | | 9,250 0 |
| 1968.12.31 දිනට ඉතිරි මුදල් | | | 45,164 67 |
| අධිකතා ඌනතා ගිණුම (විදුලිය) | | | |
| 1968.1.1 වැනි දිනට අධිකය | | 14,449 94 | |
| 1968 වර්ෂයේ සකස් කිරීම්–බැර | | 164 64 | |
| | | 14,614 58 | |
| 1968 වර්ෂයේ වැය ... | 1,45,854 34 | | |
| 1968 වර්ෂයේ අය ... | 91,471 58 | | |
| 1968 වර්ෂයේ අයට අධික වැය 1968 | | 54,382 76 | |
| 1968.12.31 වෙනි දිනට ඌණතාවය | | | 39,768 18 |
| | | | 1,65,295 92 |

තිස්සමහාරාම සුළු නගර සභාවේ සභාපති වන ගාර්දිය වසන් තුයියහැන්නැදිගේ ආර්ලිස් සිල්වා වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 වර්ෂයේ තිස්සමහාරාම සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

ජී. ටී. ආර්ලිස් සිල්වා,
සභාපති,
තිස්යමහරාම සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරන ලදී.

ඉක්. පී. පීටර් සිල්වා,
සාක්ෂි.

1969 ක්වූ නොවැම්බර් මස 13 වැනි දින මා ඉදිරිපිටදී තිස්සමහරාමයේදී සහතික කරන ලදී.

ඊ. ජයසිංහ,
සාමදාන විනිශ්චයකාර තැන.

1969 නොවැම්බර් මස 13 වන දින තිස්සමහාරාමයේදීය.

3-457—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

### 1968 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශය

**ආදයම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ. සාමාන්‍ය ආදයම් | ... ... | | 47,196 91 |
| බී. මහාමාර්ග | ... ... | | 1,843 55 |
| සී. නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... | | 7,068 0 |
| ඩී. සනීපාරක්ෂාව | ... ... | | 22,545 0 |
| ඊ. මහජන විනෝදය | ... ... | | 4,327 60 |
| එප්. සොහොන්බිම් | ... ... | | — |
| | | | 82,981 06 |
| වෙනත් ලැබීම් : | | | |
| තැන්පත් | ... ... | | 19,142 86 |
| අත්තිකාරම් | ... ... | | 2,772 0 |
| විවිධ ණයගැතියෝ | ... ... | | 5,232 86 |
| විවිධ ණයහිමියෝ | ... ... | | 20,108 78 |
| ආදයම් එකතු කිරීමේ ගිණුම් : | | | |
| දේපලබදු | ... ... | 22,599 62 | |
| කුලී ... | ... ... | 18,656 0 | |
| | | | 41,255 62 |
| 1968.1.1 දිනට මුදල් ඉතිරිය | ... | | 79,442 03 |
| | | | 2,50,935 21 |

**වියදම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ. සාමාන්‍ය ආදයම් | ... ... | | 34,793 04 |
| බී. මහා මාර්ග | ... ... | | 4,169 53 |
| සී. නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | ... | | 478 51 |
| ඩී. සනීපාරක්ෂාව | ... ... | | 44,748 30 |
| ඊ. මහජන විනෝදය | ... ... | | 237 0 |
| එප්. සොහොන්බිම් | ... ... | | 1,000 0 |
| | | | 85,426 38 |
| වෙනත් ගෙවීම් : | | | |
| තැන්පත් | ... ... | | 10,008 62 |
| අත්තිකාරම් | ... ... | | 2,535 70 |
| විවිධ ණය ගැතියෝ | ... ... | | 5,106 78 |
| විවිධ ණය හිමියෝ | ... ... | | 7,458 97 |
| ආදයම් එකතු කිරීමේ ගිණුම් : | | | |
| දේපල බදු | ... ... | 14,129 45 | |
| කුලී ... | ... ... | 18,806 0 | |
| | | | 32,935 45 |
| ස්ථිර තැන්පත් | ... ... | | 25,000 0 |
| 1968.12.31 දිනට මුදල් ඉතිරිය | ... | | 82,463 61 |
| | | | 2,50,935 21 |

අකුරැස්ස සුළු නගර සභාවේ සභාපති, දෙන් ආරියවංශ සූරියආරච්චි වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 දෙසැම්බර් 31 වැනි දිනට අකුරැස්ස සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳව සත්‍යවූත්, නිවැරදි වූත්, ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩී. ඒ. සූරියආරච්චි,
සභාපති,
අකුරැස්ස සුළු නගර සභාව.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

එන්. බී. සුමතිපාල,
අංක 3 කොට්ඨාශයේ නියෝජිත.

1969 ඔක්තෝබර් මස 31 වැනි දින දී මා ඉදිරිපිට අත්සන් කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

ඩී. බී. වෙත්තසිංහ,
සමාදාන විනිශ්චයකාර.

1969 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස සුළු නගර සභා කාර්යාලය,
අකුරැස්ස.

## අකුරැස්ස සුළු නගර සභාව

